# සෞඛ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී

# විධායක නිලධර ශ්‍රේණිය

# (නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී සහ සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී)

# සඳහා වන

# බඳවා ගැනීමේ පරීක්ෂණය.

# (SL 01 2006)

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


(917) (934)

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/3/1/13/7/201
ඔබේ අංකය / உமது இல. / Your No.: 06/E/CHEO/Recru./01/201
දිනය / திகதி / Date: 2014.05.27

02 JUL 2014
1024
29 MAY 2014
28 MAY 2014

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

**නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී හා සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරු (SL -01) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2014.05.10 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවාගැනීම් පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

බී.එම්.බී.එම්.ඒ. බටුගෙදර
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

<u>පිටපත්</u>: 01. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමග එවමි)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (මුල් පිටපත මේ සමග එවමි)

දුරකථන / தொலைபேசி இல. / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலை நகல் / Fax: 011-2369305, 011-2369302
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No. PSC/EST/3/1/13/7/2013

ඔබේ අංකය / உமது இல. / Your No. 06/E/CHEO/Recru./01/2013

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

දිනය / திகதி / Date 2014.02.20

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

04 MAR 2014   28 FEB 2014   SECRETARY MINISTRY OF HEALTH 25 FEB 2014

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

**<u>නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී හා සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරු (SL 01) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි.</u>**

උක්ත කරුණට අදාළව එවා ඇති ඔබේ සමාංක හා 2013.11.14 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී හා සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරු (SL 01) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ඇමුණුමේ සඳහන් සංශෝධනයන්ට යටත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2014.02.18 දින අනුමත කර ඇති අතර, එම සංශෝධන අනුව සකස් කළ බඳවාගැනීම් පරිපාටියේ මුල් පිටපත් 05 ක් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

බී.එම්.බී.එම්.ජේ. බටුගෙදර
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් : 1) ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව.
2) ආයතන අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

සංශෝධන ලැයිස්තුව

<table>
<tr><th>අංකය</th><th>විෂය</th><th>වෙනස් විය යුතු වාක්‍ය කොටස</th></tr>
<tr><td>1.</td><td>1.6</td><td>යොමු අංකය : PSC/EST/3/1/13/7/2013 දිනය : (රා.සේ.කො.ස. අනුමත දිනය)</td></tr>
<tr><td>2.</td><td>7.4.2.1</td><td>අධ්‍යාපන සුදුසුකම් :<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම<br>සහ<br>සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම</td></tr>
<tr><td>3.</td><td>7.4.2.3</td><td>පළපුරුද්ද : I වන ශ්‍රේණියේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියෙකු ලෙස අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>සටහන : මෙම නිලධාරීන් තනතුරට අදාළ සියළු කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතුය.</td></tr>
<tr><td>4.</td><td>7.4.2.5<br>වෙනත්</td><td>සඳහන්ව ඇති අනු අංක දෙකට අමතරව<br>III. පූර්වාසන්න වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය</td></tr>
<tr><td>5.</td><td>7.4.3<br>වයස</td><td>අදාළ නොවේ<br>(ඒ අනුව 7.4.3.1, 7.4.3.2 ඉවත් කරන්න)</td></tr>
<tr><td>6.</td><td>7.4.4.4<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :</td><td>
<table>
<tr><th>ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>අතිරේක පළපුරුද්ද</td><td>40</td><td rowspan="6">අදාළ නොවේ</td></tr>
<tr><td>අතිරේක අධ්‍යාපන සුදුසුකම්</td><td>25</td></tr>
<tr><td>පර්යේෂණ හා ප්‍රකාශණ</td><td>15</td></tr>
<tr><td>සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ දායකත්වය<br>(වැඩසටහන්/ව්‍යාපෘති සංවිධාන සඳහා)</td><td>15</td></tr>
<tr><td>සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය</td><td>05</td></tr>
<tr><td>එකතුව</td><td>100</td></tr>
</table>
සටහන : බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේදී සවිස්තරාත්මක ලකුණු පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගත යුතුය.</td></tr>
<tr><td>7.</td><td>7.4.5</td><td>අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :<br>දෙපාර්තමේන්තුවේ පොදු චක්‍ර ලේඛයක් මගින් සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.</td></tr>
<tr><td>8.</td><td>9.1</td><td>" 1. රාජ්‍ය භාෂාව " ඇති කරුණු ඉවත් කරන්න. (අනෙක් රාජ්‍ය භාෂාව අදාළ වේ)</td></tr>
<tr><td>9.</td><td>10.1.2 සිට 10.1.2.2 උසස් කිරීමේ ක්‍රමයට පසුව ඇති සටහන දක්වා හා ඇමුණුම 04</td><td>සියල්ලම සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය<br><br>(අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/12/1542/504/142-II හා 2013 ඔක්තෝබර් මස 11 දිනැති ලිපියෙන් දැනුම් දුන් 2013 ඔක්තෝබර් මස 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය අනුව "අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර ඇති බඳවා ගැනීමේ පරිපාටි සහ සේවා ව්‍යවස්ථා වල සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ විධි විධාන ඇතුලත් නොකිරීම" ට තීරණය කර ඇත.)</td></tr>
<tr><td>10.</td><td>10.2.1.1<br>i</td><td>පහත දැක්වෙන පරිදි තනතුරු වලට අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම<br><br>බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස නොසලකන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධව පශ්චාත් උපාධිය</td></tr>
<tr><td>11.</td><td>10.2.1.2 ට පසුව සංලක්ෂය</td><td>සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය</td></tr>
<tr><td>12.</td><td>11.1<br>වගුව</td><td>
<table>
<tr><th>තනතුර</th><th>සුදුසුකම්</th><th>තෝරා ගනු ලබන ආකාරය</th></tr>
<tr><td>නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී</td><td>සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරේ සේවය කරන සේවා ගණයේ II හෝ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම</td><td>නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී පුරප්පාඩු ඇති වූ විට සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී සේවය කරන II හෝ I ශ්‍රේණියේ නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨතාවය මත පත් කරනු ලැබේ</td></tr>
</table></td></tr>
<tr><td>13.</td><td>11.1<br>වගුවට පසුව ඇති සටහන</td><td>සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය</td></tr>
<tr><td>14.</td><td>ඇමුණුම 05</td><td>අනු අංක i, ii හා iii යටතේ ඇති වාක්‍ය කොටස සම්පූර්ණයෙන්ම ඉවත් කර සටහන යටතේ ඇති ඡේදය පමණක් තිබිය යුතුය. "සටහන : "යන වචනය පමණක් ඉවත් කරන්න</td></tr>
</table>

... කාර්යාලය
16 MAY 2014

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ

## විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

## (නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි සහ සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුර)

### 01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | **දෙපාර්තමේන්තුව** : අදාළ නොවේ | | |
| 1.2 | **අමාත්‍යාංශය** : සෞඛ්‍ය | **යොමු අංකය** : 06/E/CHEO/Recru./01/2013 | **දිනය** : 2013.01.16 |
| 1.3 | **කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම** | **යොමු අංකය** : DMS/C/08/45 | **දිනය** :2012.05.10 |
| 1.4 | **ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය** | **යොමු අංකය** : EST-3/RECRU/04/6639 | **දිනය**:2012.12.10 |
| 1.5 | **ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය** | **යොමු අංකය** : NSCC/4/13/SR-11<br>**යොමු අංකය** : NSCC/4/13/SR-11 | **දිනය**:2012.12.24<br>**දිනය**:2013.10.04 |
| 1.6 | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය** | **යොමු අංකය** :PSC/ EST/3/1/13/7/2013 | **දිනය**:2014.02.18 |

### 02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 **සේවා ගණය** : විධායක නිලධාරි

3.2 **ශ්‍රේණි** : III , II සහ I ශ්‍රේණි

3.3 **පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය** : පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/අණ දීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූ ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා සෞඛ්‍ය ආයතන වල අංශ ප්‍රධානියාට පැවරෙන සමස්ථ කාර්ය භාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරාදෙනු ලබන කාර්යයන්.

3.4 **කාර්යයන් පැවරීම** : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

### 04. තනතුරෙහි / තනතුරු වල ස්වභාවය : ස්ථිර. විශ්‍රාම වැටුප් සහිත.

## 5. වැටුප්

5.1 **වැටුප් කේත අංකය** : SL -1- 2006

5.2 **වැටුප් පරිමාණය** : රු: 22,935-10x645-8x790-17x1050-53,555

5.3 **ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර**

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු.) |
|---|---|---|
| III ශ්‍රේණිය | (SL - 1-2006 ) 1පියවර | රු: 22,935/- |
| II ශ්‍රේණිය | (SL - 1-2006 ) 12 පියවර | රු: 30,175/- |
| I ශ්‍රේණිය | (SL - 1-2006 ) 20 පියවර | රු: 36,755/- |

## 6. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 **අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :**

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 01. | නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි | II | 01 | i. සෞඛ්‍ය ප්‍රවර්ධන හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් ජාතික මට්ටමෙන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නියාමනය, ඇගයීම හා සම්බන්ධීකරණය සඳහා අදාළ ඒකක වලට සහය වීම.<br>ii. සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි දිස්ත්‍රික් මට්ටමේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් හා අනෙකුත් ආයතනයන්හි සේවයේ නියුතු සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය හා තාක්ෂණ කටයුතු අධීක්ෂණය<br>iii. සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ සියළුම ඒකක සමඟ සම්බන්ධීකරණය<br>iv. ප්‍රජාවගේ චර්යා වෙනස්වීම් වලට අදාළ පර්යේෂණ කාර්ය ඉටු කිරීම සඳහා අදාල ඒකක වලට සහය වීම.<br>v. සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳව මානව සම්පත් ප්‍රවර්ධනය හා ශක්‍යතා වර්ධනය සඳහා සහය වීම.<br>vi. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාංශ,ඒකක හා ආයතන සමඟ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් සම්බන්ධීකරණය.<br>vii. ජාතික මට්ටමේ රාජ්‍ය දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සෞඛ්‍ය අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන් සම්බන්ධීකරණය හා තාක්ෂණික උපදේශකයෙකු ලෙස කාර්යය ඉටු කිරීම.<br>viii. ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානයන්හි සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය හා ඇගයීම සඳහා මඟ පෙන්වීම.<br>ix. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |

| | | | | |
|---|---|---|---|---|
| 02. | සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී | III | 01 | i. ජාතික මට්ටමින් සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම , නියාමනය කිරීම සහ ඇගයීම් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ හට සහාය වීම.<br>ii. සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය තුළ එක් එක් ඒකකයන්හි සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.<br>iii. දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්හට මඟ පෙන්වීම සහ ඔවුන්ගේ සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.<br>iv. දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්ගේ සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම.<br>v. විවිධ තරාතිරම් වලට අයත් සෞඛ්‍ය නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා (සෞඛ්‍ය අධ්‍යාපන) තක්සේරු කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනික වැඩ සටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.<br>vi. සෞඛ්‍ය අධ්‍යාපන විෂයෙහි පර්යේෂණ හා ඇගයීම්.<br>vii. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්හි විවිධ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.<br>viii. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී. |

6.2 **ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව** : එක් එක් තනතුරට අදාළව ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III,II හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

| අනු අංකය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | නියෝජ්‍ය අධ්‍යක්ෂ /ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී | 01 |
| 2. | සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී | 01 |

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| අනු අංකය | අනුමත තනතුර | ධාරාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. | සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී | විවෘත | නැත |
| | | සීමිත | නැත |
| | | කුසලතා | 100% |

7.2 **විවෘත බඳවා ගැනීම** : අදාල නොවේ.

7.3 **සීමිත බඳවා ගැනීම** : අදාල නොවේ.

7.4 **කුසලතා පදනම මත බඳවා ගැනීම :** සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුර සඳහා පමණි.

7.4.1 **බඳවා ගන්නා ශ්‍රේණිය** : III ශ්‍රේණිය

7.4.2 **සුදුසුකම් :**

7.4.2.1 **අධ්‍යාපන සුදුසුකම්** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

සහ

සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

7.4.2.2 **වෘත්තීය සුදුසුකම්** : I වන ශ්‍රේණියේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියෙකු වීම.

7.4.2.3 **පළපුරුද්ද** : I වන ශ්‍රේණියේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියෙකු ලෙස අවුරුදු 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන:** මෙම නිලධාරීන් තනතුරට අදාල සියලු කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතුය.

7.4.2.4 **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 **වෙනත්** :

I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

II. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

III. පූර්වාසන්න වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 **වයස** : අදාල නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.4.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අදාල නොවේ.

7.4.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : සහකාර සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුර සඳහා පමණි.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| * අතිරේක පළපුරුද්ද | 40 | අදාල නොවේ |
| * අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | |
| * පර්යේෂණ හා ප්‍රකාශන | 15 | |
| * සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ දායකත්වය (වැඩසටහන්/ ව්‍යාපෘති සංවිධාන සඳහා ) | 15 | |
| * සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 100 | |

සටහන: බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේදී සවිස්තරාත්මක ලකුණු පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගත යුතුය.

7.4.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : දෙපාර්තමේන්තුවේ පොදු චක්‍රලේඛයක් මගින් සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය.- ඇමුණුම 01 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වැනි ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය.- ඇමුණුම 02 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වැනි ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් වීමට පෙර | ලිඛිත පරීක්ෂණය.- ඇමුණුම 03 |

8.2 **කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :** වසරකට දෙවරක්

8.3 **කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :**

**1 වන කාර්යක්ෂමතා කඩඉම**
**2 වන කාර්යක්ෂමතා කඩඉම**
**3 වන කාර්යක්ෂමතා කඩඉම**

: විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
: විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

## 09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 **III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.**

**10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව**

10.1.1.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

(vi) අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 **උසස් කිරීමේ ක්‍රමය** :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 **II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.**

10.2.1 **සාමාන්‍ය කාර්ය සාධනය අනුව .**

10.2.1.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස නොසලකන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ii) නිලධර ගණයේ යටතේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 **උසස් කිරීමේ ක්‍රමය** :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය :

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු ය.

## 11. තනතුරු වලට පත් කිරීම

### 11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| 1. නියෝජ්‍ය අධ්‍යක්ෂ /ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිළධාරී | * සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිළධාරී තනතුරේ සේවය කරන සේවා ගණයේ II හෝ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. | නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිළධාරී පුරප්පාඩු ඇති වූ විට සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී සේවය කරන II හෝ I ශ්‍රේණියේ නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨතාවය මත පත් කරනු ලැබේ. |

## 12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

I. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත්කිරීම් / බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

II. බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි/ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන විධිවිධාන අදාළ වේ.

## 13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

**"සක්‍රීය සේවා කාලය"** යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:** ඇමුණුම 04

**15.** **සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළවේ.**

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ අත්සන : .......................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එච්.ඒ.ර්.සෝමරත්න

තනතුර : වැ./බ. අධ්‍යක්ෂ (පාලන) 06

දිනය : ...2014.04.16......

පරීක්ෂා කළේ අත්සන : .......................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : කේ.ටී.ඩී.සී.විමලසිරි

තනතුර : වැ.බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I

දිනය : 2014.04.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : ...2014/04/23.

අත්සන : .......................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම :වෛද්‍ය පී.ජී.මහීපාල

තනතුර : සෞඛ්‍ය සේවා සේවා අධ්‍යක්ෂ ජනරාල්

නිල මුද්‍රාව : .......................

---

යොමු අංකය : 06/E/CHEO/Recru./01/2013

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි විධායක නිළධර ගණය(නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි සහ සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි) SL-1-2006 වැටුප් පරිමාණයට අදාළ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : .......................

නම : වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

දිනය : 2014/05/10......

නිල මුද්‍රාව : .......................

---

යොමු අංකය : PSC/EST/3/1/13/7/2013

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි විධායක නිළධර ගණය(නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි සහ සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි) SL-1-2006 වැටුප් පරිමාණයට අදාළ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය ...2014-02-18 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : .......................

නම : .......................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014-09-26

නිල මුද්‍රාව : .......................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

## ඇමුණුම - 01

## සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි විධායක සේවා ගණය සඳහා වන III ශ්‍රේණියේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. **විභාගයේ නම** : විධායක නිලධර ගණය (SL-1-2006(ඒ)) III ශ්‍රේණිය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන රෙගුලාසි | පැය 03යි | 100 | 40 % |
| 2. මූල්‍ය ක්‍රම | පැය 03යි | 100 | 40 % |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය 03යි | 100 | 40 % |

03. **පවත්වනු ලබන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| **1.ආයතන රෙගුලාසි** | ආයතන සංග්‍රහයේ<br><br>11 පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි සහ පත්කිරීම්<br>V පරිච්ඡේදය - මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම.<br>X11 පරිච්ඡේදය - නිවාඩු<br>XV පරිච්ඡේදය - අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම.<br>XVI පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XXV111 පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXX පරිච්ඡේදය - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXX111 පරිච්ඡේදය - නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග<br>XLV11 පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම සහ විනය<br>XLV111 පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

| | |
|---|---|
| | * අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති<br>III වැනි පරිච්ඡේදය - පත් කිරීම<br>V වැනි පරිච්ඡේදය - රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන්<br>VI වැනි පරිච්ඡේදය - පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් කොන්දේසි<br>VII වැනි පරිච්ඡේදය - පත් කිරීම්වලදී අනුගමනය කළ යුතු පටිපාටිය<br>VIII වැනි පරිච්ඡේදය - පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම<br>XIV වැනි පරිච්ඡේදය - පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම<br>XV වැනි පරිච්ඡේදය - තනතුර අතහැර යාම |
| 2. මූල්‍ය ක්‍රම | මුදල් රෙගුලාසි සංග්‍රහය<br>I පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු.<br>II පරිච්ඡේදය - වියදම්, අත්හැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාර බලය.<br>III පරිච්ඡේදය - මුදල් පාලනය හා ගිණුම් ගතකළ හැකි වීම.<br>IV පරිච්ඡේදය - ලැබීම්.<br>V පරිච්ඡේදය - ගෙවීම්.<br>VI පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්.<br>X පරිච්ඡේදය - උසාවිවල ගිණුම්<br>XI පරිච්ඡේදය - විදේශ අධාර<br>XIII පරිච්ඡේදය - සැපයුම් , වැඩ හා සේවා<br><br>* රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි | රෝගී සත්කාර සේවාව සහ ප්‍රජා සෞඛ්‍ය සේවාවට අදාලව චක්‍රලේඛ උපදෙස් හා රෙගුලාසි |

සකස් කළේ අත්සන : ...HAE Somath...........
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර : වැ./බ.අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : ..2014.04.16.....

පරීක්ෂා කළේ අත්සන : ...........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.වී.ඩී.සී.විමලසිරි
තනතුර :වැ./බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.4.17...

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ...........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර :සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : ..2014/04/23.............
නිලමුද්‍රාව : ...........................................

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

## ඇමුණුම - 02

## සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි විධායක සේවා ගණය සඳහා වන II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. **විභාගයේ නම** : විධායක නිලධර ගණය (SL-1-2006(ඒ)) II ශ්‍රේණිය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.විෂයය දැනුම | පැය 02යි | 100 | 40 % |

03. **පවත්වනු ලබන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | තනතුර | විෂය නිර්දේශය |
|---|---|---|
| 1.විෂයය දැනුම | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී සහ සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී | සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ප්‍රශ්න පත්‍රය සැකසේ. |

සකස් කළේ අත්සන : ..H.A.[signature]..........
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ර්.සෝමරත්න
තනතුර : වැ./බ.අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014.04.16......

පරීක්ෂා කළේ අත්සන : [signature]..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.ටී.ඩී.සී.විමලසිරි
තනතුර :වැ./බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : ..2014.04.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර :සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : ...2014/04/25..................
නිලමුද්‍රාව : ..........................................

ඇමුණුම - 03

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි විධායක සේවා ගණය සඳහා වන**

**I ශ්‍රේණියේ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. **විභාගයේ නම** : විධායක නිලධර ගණය (SL-1-2006(ඒ)) I ශ්‍රේණිය සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සිද්ධි අධ්‍යයනය | පැය 03 | 100 | 40 % |

03. **පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | තනතුර | විෂය නිර්දේශය |
|---|---|---|
| සිද්ධි අධ්‍යයනය | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී සහ සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී | තනතුරට අදාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිර්මාණය කරනු ලබන ගැටළු සහගත සිද්ධීන් එකක් හෝ වැඩිගණනක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. එමගින් අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය, නිර්මාණශීලිත්වය, ගැටළු විශ්ලේෂණය යනාදිය හා නිවැරදි තීරණ ගැනීම හැකියාව සහ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව ඔවුන් තුළ පවත්නා අවබෝධය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සිද්ධි අධ්‍යයන 03 කට පිළිතුරු සැපයිය යුතුය. |

සකස් කළේ අත්සන : ..................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එච්.ඒ.ර්.සෝමරත්න

තනතුර : වැ./බ.අධ්‍යක්ෂ (පාලන) 06

දිනය : 2014.04.16

පරීක්ෂා කළේ අත්සන : ..................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : කේ.වී.බී.සී.විමලසිරි

තනතුර : වැ./බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I

දිනය : 2014.04.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : වෛද්‍ය පී.ජී.මහීපාල

තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2014/04/23

නිලමුද්‍රාව : ..................

## ඇමුණුම - 04

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි විධායක සේවා ගණය සඳහා වන**
**සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම**
**( බඳවා ගැනීමේ පර්පාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)**

නව බඳවා ගැනීම් පර්පාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පර්පාලන චක්‍රලේඛ අංක: 06/2006 මගින් ලබා දී ඇති SL 1- 2006 වැටුප් පර්මාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළු දෙනාම එකී දින වන විට ලබා සිටි ශ්‍රේණිය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පර්ච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරියාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පර්වර්තනයේ දී අදාළ නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපි වීම මත ආයතන සංග්‍රහයේ VII පර්ච්ඡේදයේ 4 .4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරේ දැනට සේවයේ නියුතු නිලධාරියා SL 01 -2006 වැටුප් ක්‍රමයේ II ශ්‍රේණියටත් සහකාර ප්‍රධාන සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරේ දැනට සේවයේ නියුතු නිලධාරියා SL 01 -2006 වැටුප් ක්‍රමයේ III ශ්‍රේණියටත් අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ අත්සන : ..................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ර්.සෝමරත්න
තනතුර : වැ./බ.අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014.04.16

පර්ක්ෂා කළේ අත්සන : ..................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.ටී.බී.සී.විමලසිරි
තනතුර :වැ./බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.04.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර :සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014/04/23
නිලමුද්‍රාව : ..................